# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

பொலிஸ் ஊடகப் பிரிவு

POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2026.04.18 පැය 1430 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out / 624 /2026 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**ඉන්දිය උප ජනාධිපතිතුමාගේ ශ්‍රී ලංකා සංචාරයට අදාළ රථවාහන සැලැස්ම - කොළඹ රථවාහන කොට්ඨාසය.**

ඉන්දිය උප ජනාධිපති ගරු සී.පී. රාධක්‍රිෂ්ණන් මහතා 2026.04.19 හා 20 යන දෙදින තුල ශ්‍රී ලංකාවේ නිල සංචාරයක නිරත වීමට නියමිතව ඇත. එම සංචාරයට අදාල කාල සීමාව තුල කොළඹ රථවාහන කොට්ඨාසය මගින් විශේෂ රථවාහන සැළැස්මක් ක්‍රියාත්මක කිරීමට කටයුතු සැළසුම් කර ඇත.

- ඒ අනුව ප්‍රභූවරයා 2026.04.19 දින උදෑසන කටුනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොලට පැමිණීමෙන් පසු කටුනායක කොළඹ අධිවේගී මාර්ගයේ පැමිණ ග්‍රෑන්ඩ්පාස් ඔරුගොඩවත්ත හන්දියෙන් බේස්ලයින් පාර ඔස්සේ බොරැල්ල හන්දිය, ඩී.එස්.සේනානායක හන්දියෙන් දකුණට හැරී හෝර්ටන් පෙදෙස ඔස්සේ නෙළුම් පොකුණ වටරවුම, ආනන්ද කුමාරස්වාමි මාවත, පුස්තකාල හන්දිය, මල් පාර හන්දිය, ලිබර්ටි වටරවුමෙන් දකුණට හැරී ශාන්ත මයිකල් වටරවුමෙන් වමට හැරී ශාන්ත මයිකල් පාර, ගාලු පාර ශාන්ත මයිකල් පාර හන්දියෙන් දකුණට හැරී ගාලු පාර ඔස්සේ ගාලු මුවදොර වටරවුම, ගාලු මැද පාර ඔස්සේ ටාජ් සමුද්‍රා හෝටලයට ගමන් කිරීමට නියමිතව ඇත.

ප්‍රභූවරයා ගමන් ගන්නා කාලය තුල ඉහත ගමන් මාර්ගයන්හි ගමන් ගන්නා රථ වාහන සඳහා පහත සඳහන් විකල්ප මාර්ග භාවිතා කල හැක.

**විකල්ප මාර්ග -**

- නුවර පාරෙන් කොළඹට ඇතුළුවන සාමාන්‍ය රථවාහන කැලණි පාලමෙන් කොළඹට ඇතුළු වී ග්‍රෑන්ඩ්පාස් බණ්ඩාරනායක පාරෙන් දකුණට හැරී ඉඟුරුකඩේ හන්දිය දක්වා ගමන් කර එතැනින් වමට හැරී වේල්ස් කුමාර මාවත, ආමර් බාබර් වීදිය හන්දියෙන් වමට හැරී පංචිකාවත්ත වටරවුම මරදාන පාලම් හන්දියෙන් වමට හැරී මරදාන පාර ඔස්සේ බොරැල්ල දක්වා ගමන් කර අවස්ථානුකූලව බොරැල්ල හන්දියෙන් කොටා පාරට ඇතුළු වීමට අවස්ථාව සලසා දෙනු ලබයි.

- ගාලු පාර ඔස්සේ, හයිලෙවල් පාර සහ බේස්ලයින් පාර ඔස්සේ කොළඹට ඇතුළුවන රථවාහන බොරැල්ල කනත්ත වටරවුමට ඇතුළු කර පරණ බුලර්ස් පාර, මොඩල් ෆාම් හන්දිය, කාසල් වීදිය, ආයුර්වේද හන්දිය, පරණ පාර, ඔබේසේකරපුර හන්දියෙන් වමට හැරී කොලොන්නාව, වැල්ලම්පිටිය, අංගොඩ

හන්දිය, කැලණිමුල්ල, කැලණිය හරහා නුවර පාරට හා මීගමුව පාරට ගමන් කළ හැකිය.

- කොළඹ කොටුව, පිටකොටුව දෙස සිට මීගමුව පාරට නුවර පාරට සහ අවිස්සාවේල්ල පාරට ගමන් කරන රථවාහන ඕල්කට් මාවත, කාර්මික විද්‍යාල හන්දිය පංචිකාවත්ත වටරවුමෙන් වමට හැරී ආමර් වීදිය හන්දිය ආමර් බාබර් වීදිය හන්දිය වේල්ස් කුමාර මාවත හන්දිය, ඉඟුරුකඩේ හන්දිය, තොටළඟ හන්දිය, නවලෝක හන්දිය, නවලෝක වටරවුමෙන් වමට හැරී මීගමුව පාරට ද දකුණට හැරී අවිස්සාවේල්ල දෙසට ගමන් කරන රථවාහන නුවර පාර හතරේ කණුව හන්දියෙන් දකුණට හැරී කැලණිය බියගම මාර්ගයේ ගමන් කර බණ්ඩාරවත්ත හන්දියෙන් දකුණට හැරී කඩුවෙල හන්දියට ගමන් කර වමට හැරී අවිස්සාවේල්ල දෙසට ගමන් කළ හැකිය.

- කොටුව, පිටකොටුව, කොම්පඤ්ඤවීදිය දෙස සිට ගාලු පාරට හයිලෙවල් පාරට 120 මාර්ගයට ගමන් කරන රථවාහන ලිප්ටන් වටරවුම, සොයිසා වටරවුම, කන්නන්ගර මාවත ඔස්සේ ගමන් කර ප්‍රභූ රථ පෙළට බාධාවක් නොවන පරිදි අවස්ථානුකූලව හරහා යාමට අවස්ථාව ලබාදෙන අතර, ඒ අනුව කන්නන්ගර මාවතෙන් පැමිණ නෙළුම් පොකුණ වටරවුම හරහා නන්දා මෝටර්ස් හන්දිය නිදහස් වටරවුම, රීඩ් මාවත ඔස්සේ තුම්මුල්ල දක්වා ගමන් කර පිට විය හැක.

- **2026.04.19 දින ප්‍රභූවරයා ටාජ් සමුද්‍රා හෝටලයේ සිට ජනාධිපති ලේකම් කාර්යාලය දක්වා ගමන් කිරීමට නියමිතව ඇති අතර එහිදී** ගාලු මුවදොර ටාජ් සමුද්‍රා හෝටලයේ සිට ගාලු මැද පාර, බාලදක්ෂ මාවත හන්දිය ඔස්සේ ජනාධිපති ලේකම් කාර්යාලය දක්වා ගමන් කර නැවත එම මාර්ගයේම ටාජ් සමුද්‍රා හෝටලය වෙත ගමන් කිරීමට නියමිතය. එම අවස්ථාවේ පහත සඳහන් විකල්ප මාර්ග භාවිතා කල හැක.

**විකල්ප මාර්ග -**

- කොළඹින් පිටවන සියලුම රථවාහන කොටුව සෙරමික් හන්දියෙන් වමට හැරී රීගල් වටරවුම, චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොම්පඤ්ඤවීදිය පොලිසිය වටරවුම, කුමාරරත්නම් පාර, කොම්පඤ්ඤවීදිය හන්දිය, සර් ජේම්ස් පීරිස් මාවත, පිත්තල හන්දිය, රතු කුරුස හන්දිය, පුස්තකාල වටරවුමෙන් දකුණට හැරී ආනන්ද කුමාරස්වාමි මාවත, ලිබර්ටි වටරවුමෙන් වමට හැරී ආර් ඒ ද මෙල් මාවත ඔස්සේ කොළඹින් පිටවිය හැකිය.

- ගාලු පාර ඔස්සේ කොළඹට ඇතුළු වන රථවාහන සඳහා ගාලු මුවදොර වටරවුමෙන් දකුණට හරවා කොම්පඤ්ඤවීදිය දෙසට ගමන් කර කොළඹට ඇතුළු විය හැක.

- **ප්‍රභූවරයා ටාජ් සමුද්‍රා හෝටලයේ සිට ගාලු මුවදොර වටරවුම ගාලු පාර, ගාලු පාර ශාන්ත මයිකල් පාර, ශාන්ත මයිකල් වටරවුම, උත්තරානන්ද මාවත ඔස්සේ අරලියගහ මන්දිරය වෙත හා නැවත හෝටලය දක්වා ගමන් කිරීමට නියමිත අතර එම අවස්ථාවේ පහත සඳහන් විකල්ප මාර්ග භාවිතා කල හැක.**

**විකල්ප මාර්ග -**

- ගාලු පාර ඔස්සේ කොළඹට ගමන් කරන සියලුම රථවාහන කොල්ලුපිටිය හන්දියෙන් දකුණට හැරී ලිබර්ටි වටරවුම, පිත්තල හන්දිය, සර් ජේම්ස් පීරිස් මාවත, කොම්පඤ්ඤවීදිය හන්දිය ඔස්සේ කොළඹට ඇතුළු විය හැක.
- පිටකොටුවෙන් පිට වී ගාලු පාරට ගමන් කරන කොළඹින් පිටවන සියලුම රථවාහන කොටුව සෙරමික් හන්දියෙන් වමට හැරී රියල් වටරවුම, චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොම්පඤ්ඤවීදිය පොලිසිය වටරවුම, කුමාරරත්නම් පාර, කොම්පඤ්ඤවීදිය හන්දිය, සර් ජේම්ස් පීරිස් මාවත, පිත්තල හන්දිය, රතු කුරුස හන්දිය, පුස්තකාල වටරවුමෙන් දකුණට හැරී ආනන්ද කුමාරස්වාමි මාවත, ලිබර්ටි වටරවුමෙන් වමට හැරී ආර් ඒ ද මෙල් මාවත ඔස්සේ කොළඹින් පිට විය හැක.

➢ **ප්‍රභූවරයා ටාජ් සමුද්‍රා හෝටලයේ සිට ගාලු මුවදොර වටරවුම, ගාලු පාර, කොල්ලුපිටිය හන්දිය, ධර්මපාල මාවත, ලිබර්ටි වටරවුම, ආර්.ඒ.ද මෙල් මාවත, බෞද්ධාලෝක මාවත හන්දිය, ආර්.ඒ.ද මෙල් මාවත ලෝරන්ස් පාර හන්දිය, ගාලුපාර ලෝරන්ස් පාර හන්දිය, කදිරේෂන් කෝවිල දක්වා ගමන් කර ගාලු පාර, බම්බලපිටිය හන්දිය , ලිබර්ටි හන්දිය, පිත්තල හන්දිය, ජේම්ස් පීරිස් මාවත ජිනරථන හන්දිය, පෙරහර මාවත හන්දිය, උත්තරානන්ද මාවත රොටුන්ඩා හන්දිය, අලියා නාන වටරවුම, ගාලු මුවදොර වටරවුම, ගාලු මැද පාර ඔස්සේ ටාජ් සමුද්‍රා හෝටලයට ගමන් කිරීමට නියමිතව ඇත. එම අවස්ථාවේදී  පහත සඳහන් විකල්ප මාර්ග භාවිතා කල හැක.**

**විකල්ප මාර්ග -**

- කොළඹ පිටකොටුව දෙස සිට කොළඹින් පිට වී හයිලෙවල් පාර, ගාලු පාර හා 120 මාර්ගයට ගමන් කරන සියලුම රථවාහන ලිප්ටන් වටරවුම, සොයිසා වටරවුම කන්නන්ගර මාවත ඔස්සේ නෙළුම් පොකුණ වටරවුම හරහා නන්දා මෝටර්ස් හන්දිය, නිදහස් වටරවුම, රීඩ් මාවත ඔස්සේ කොළඹින් පිටවිය හැක.
- ගාලු පාර, හැව්ලොක් පාර, හයිලෙවල් පාර ඔස්සේ කොළඹට ඇතුළුවන රථවාහන තුම්මුල්ල හන්දියට ගමන් කර රීඩ් මාවත තර්ස්ටන් පාර, ජේඹිසී හන්දිය, ග්ලාස් හවුස් හන්දිය, නන්දා මෝටර්ස් හන්දිය හරහා නෙළුම් පොකුණ හරහා කන්නන්ගර මාවත ඔස්සේ සොයිසා වටරවුම හරහා ගමන් කිරීමට අවස්ථාව ලබාදෙනු ලැබේ.

➢ **2025.04.20 දින ප්‍රභූවරයා ටාජ් සමුද්‍රා හෝටලයේ සිට ගාලු මැද පාර, NSA වටරවුම, චෛත්‍ය පාර හරහා වරාය හෙළි පථය වෙත ගමන් කිරීමට නියමිතව ඇති අතර එම අවස්ථාවේදී රථවාහන සඳහා පහත සඳහන් විකල්ප මාර්ග භාවිතා කල හැකිය.**

**විකල්ප මාර්ග -**

- ගාලු පාර ඔස්සේ කොළඹට ඇතුළු වන සියලුම බරවාහන කොල්ලුපිටිය හන්දියෙන් දකුණට හැරී ලිබර්ටි වටරවුම, පිත්තල හන්දිය සර්.ජේම්ස් පීරිස් මාවත, කොම්පඤ්ඤවීදිය හන්දිය ඔස්සේ කොළඹට ඇතුළු විය හැක. ගාලු පාර

ඔස්සේ කොළඹට ඇතුළු වන සැහැල්ලු රථවාහන ගාලු මෝදර වටරවුමෙන් දකුණට හැරී මාකන් මාකර් මාවත, ජස්ටින් අක්බාර් මාවත, කොම්පඤ්ඤවීදිය මැලේ වීදිය ඔස්සේ කොළඹට ඇතුළුවිය හැක.

- පිටකොටුවෙන් පිට වී ගාලු පාරට ගමන් කරන කොළඹින් පිටවන සියලුම රථවාහන කොටුව සෙරමික් හන්දියෙන් වමට හැරී රීගල් වටරවුම, චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොම්පඤ්ඤවීදිය පොලිසිය වටරවුම, කුමාර රත්නම් පාර, කොම්පඤ්ඤවීදිය හන්දිය, සර්.ජේම්ස් පීරිස් මාවත, පිත්තල හන්දිය, රතු කුරුස හන්දිය, පුස්තකාල වටරවුමෙන් දකුණට හැරී ආනන්ද කුමාරස්වාමි මාවත ලිබර්ටි වටරවුමෙන් වමට හැරී ආර්.ඒ. ද මෙල් මාවත ඔස්සේ කොළඹින් පිටවිය හැකිය.
- ජනාධිපති මාවතෙන් ගාලු පාරට ගමන් කරන සියලුම රථවාහන ජනාධිපති මාවතෙන් වමට හැරී ලංකා බැංකු මාවත, යෝර්ක් වීදිය, වැතැම්වීදිය, , CTO හන්දිය, සෙරමික් හන්දියෙන් වමට හැරී රීගල් වටරවුම, චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොම්පඤ්ඤවීදිය පොලිසිය වටරවුම, කුමාරරත්නම් පාර, කොම්පඤ්ඤවීදිය හන්දිය, සර් ජේම්ස් පීරිස් මාවත, පිත්තල හන්දිය, රතු කුරුස හන්දිය, පුස්තකාල වටරවුමෙන් දකුණට හැරී ආනන්ද කුමාරස්වාමි මාවත ලිබර්ටි වටරවුමෙන් වමට හැරී ආර්.ඒ. ද මෙල් මාවත ඔස්සේ කොළඹින් පිටවිය හැකිය.

මීට අමතරව අවස්ථානුකූලව ඇති වන තත්ත්වයන් අනුව ඉහත දක්වා ඇති මාර්ගයන්හි වරින් වර 2026.04.19 හා 20 දිනයන්හි ප්‍රභූ සංචාරයට යෙදීමට අදාළව රථවාහන ගමනාගමනය සීමා කිරීම් සිදුවිය හැකිය.

ගමන් ආරම්භ කිරීමට පැය දෙකකට පෙර සිට ඉහත ගමන් මාර්ගයට බර වාහන (කන්ටේනර් රථ, ප්‍රයිමුවර් රථ, ගල් වැලි පස් හා සිමෙන්ති පටවන ලද ටිපර් රථ හා අනෙකුත් ලොරි රථ) ඇතුළු නොකෙරෙන අතර සියළුම වාහන ඇතුළුවීම සීමා කරනු ලබයි.

ප්‍රභූවරයාගේ සංචාරක කාලසීමාව තුල ඉහත රථවාහන සැළැස්මට අනුව විකල්ප මාර්ග භාවිතා කර රථවාහන ධාවනය කරන ලෙසට එම ප්‍රදේශය හරහා ගමන් කරන රථවාහන රියැදුරන්ගෙන් හා මහජනතාවගෙන් පොලිසිය ඉල්ලා සිටී.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**

## இந்திய துணை ஜனாதிபதியின் இலங்கை பயணத்திற்கான போக்குவரத்து திட்டம் – கொழும்பு போக்குவரத்து பிரிவு

*இந்திய துணை ஜனாதிபதி மாண்புமிகு சி.பி. ராதாகிருஷ்ணன் அவர்கள் 2026.04.19 மற்றும் 20 ஆகிய இரு நாட்களிலும் இலங்கையில் உத்தியோகப்பூர்வ விஜயம் மேற்கொள்ள உள்ளார். இந்த பயணத்திற்கான காலப்பகுதியில் கொழும்பு போக்குவரத்து பிரிவினால் விசேடப் போக்குவரத்து திட்டம் நடைமுறைப்படுத்த திட்டமிடப்பட்டுள்ளது.*

➤ *2026.04.19* – **விமான நிலையம் முதல் ஹோட்டல் வரை பயணம்**

பிரதிநிதி 2026.04.19 அன்று காலை கட்டுநாயக்க சர்வதேச விமான நிலையத்தை வந்தடைவார். பின்னர் கட்டுநாயக்க – கொழும்பு அதிவேக நெடுஞ்சாலை வழியாக கிராண்ட்பாஸ், ஒருகொடவத்த சந்தி வழியாக பேஸ்லைன் வீதி, போரெல்ல சந்தி, D.S. சேனாநாயக்க சந்தி (வலது திருப்பு), ஹோர்டன் பிளேஸ், தாமரைக் கோபுரம் சுற்றுவட்டம், ஆனந்த குமாரசுவாமி மாவத்தை, நூலக சந்தி, மல்போட் சந்தி, லிபர்டி சுற்றுவட்டம் (வலது திருப்பு), செயிண்ட் மைக்கேல் வட்டச்சுழல் (இடது திருப்பு), செயிண்ட் மைக்கேல் வீதி, காலி சாலை வழியாக காலிமுகத் திடல் வட்டச்சுழல், காலி மிடில் ரோடு வழியாக தாஜ் சமுத்ரா ஹோட்டலுக்கு செல்ல திட்டமிடப்பட்டுள்ளது.

இந்த நேரத்தில் மேலே குறிப்பிடப்பட்ட பாதைகளில் செல்லும் வாகனங்களுக்கு கீழ்க்கண்ட மாற்றுப் பாதைகள் பயன்படுத்தலாம்:

**➤ மாற்றுப் பாதைகள்**

- நுவரெலியா வீதி வழியாக கொழும்பு வரும் வாகனங்கள் களனி பாலம் வழியாக வந்து கிராண்ட்பாஸ் பண்டாரநாயக்க சாலை, இங்குருகடே சந்தி, வேல்ஸ் குமார மாவத்தை, ஆமர் வீதி, பஞ்சிகாவத்தை சுற்றுவட்டம், மருதானை பாலம் சந்தி, மருதானை வீதி வழியாக பொரளை சென்று கோட்டை வீதியில் செல்லலாம்.
- காலி வீதி, ஹை லெவல் வீதி மற்றும் பேஸ்லைன் வீதி வழியாக வரும் வாகனங்கள் போரெல்ல கல்லறை வட்டச்சுழல், பழைய புல்லர்ஸ் வீதி, மாடல் ஃபார்ம் சந்தி, காஸில் வீதி, ஆயுர்வேத சந்தி, ஓபேசேகரபுர, கொலோன்னாவ, வெல்லம்பிட்டிய, அங்கொட, களணிமுல்ல, களணி வழியாக நுவரெலியா மற்றும் நீர்கொழும்பு வீதிக்கு செல்லலாம்.
- கோட்டை பகுதிகளில் இருந்து நுவரெலியா, நீர்கொழும்பு மற்றும் அவிசாவெல்ல வீதிகளுக்கு செல்லும் வாகனங்கள் பஞ்சிகாவத்தை, ஆமர் வீதி, வேல்ஸ் குமார சந்தி, இங்குருகடே சந்தி, தொட்டலங்க, நவலோக்க சந்தி, மொரட்டுவ வழியாக செல்லலாம்.
- கொழும்பு 120 வழி மற்றும் ஹை லெவல் வீதியில் செல்லும் வாகனங்கள் லிப்டன் வட்டச்சுழல், சொய்ஸா வட்டச்சுழல், கன்னங்கர மாவத்தை வழியாக நெலும் பொக்குண வட்டச்சுழல், ரீட் மாவத்தை, தும்முல்ல வழியாக செல்லலாம்.

**➤ தாஜ் சமுத்ரா – ஜனாதிபதி செயலகம் பயணம் (19.04.2026)**

பிரதிநிதி தாஜ் சமுத்ரா ஹோட்டலில் இருந்து ஜனாதிபதி செயலகம் வரை காலி மிடில் ரோடு, ஸ்கவுட் மாவத்தை வழியாக சென்று மீண்டும் அதே பாதையில் திரும்புவார்.

இந்த நேரத்தில் மாற்றுப் பாதைகள்:

- கோட்டை/காலி வீதி வழியாக செல்லும் வாகனங்கள் லிபர்டி வட்டச்சுழல், ஜேம்ஸ் பீரிஸ் மாவத்தை, கொம்பனிவீதி வழியாக செல்லலாம்.

- *புறக்கோட்டை பகுதிகளில் இருந்து வெளியேறும் வாகனங்கள் செராமிக் சந்தி, ரீகல் வட்டச்சுழல், ஆமர் வீதி வழியாக வெளியேறலாம்.*

**➤ *தாஜ் சமுத்ரா – காலி மிடில் ரோடு – அலக்ஹறியா பணி வழி***

*இந்த நேரத்தில் காலி வீதி, லிபர்டி, பித்தல சந்தி, ரீட் மாவத்தை, தும்முல்ல, நெலும் பொக்குண வழியாக மாற்றுப் பாதைகள் வழங்கப்படும்.*

**➤ *20.04.2026 – துறைமுக பகுதி பயணம்***

*தாஜ் சமுத்ராவில் இருந்து காலி மிடில் ரோடு, NSA வட்டச்சுழல், சைத்யா வீதி வழியாக துறைமுக ஹெலிபாத் நோக்கி செல்லும் போது மாற்றுப் பாதைகள்:*

- *காலி வீதி வழியாக வரும் கனரக வாகனங்கள் லிபர்டி, பித்தல சந்தி, கொம்பனிவீதி வழியாக செல்லலாம்.*
- *லேசான வாகனங்கள் கோல்பீட்டி வட்டச்சுழல், மாக்கன் மார்க்கர், கொம்பனிவீதி வழியாக செல்லலாம்.*

**➤ *பொதுவான அறிவிப்பு***

*மேலே குறிப்பிட்ட பாதைகளில் பயணிக்கும் போது 2026.04.19 மற்றும் 20 ஆகிய திகதிகளில் தேவைக்கேற்ப தற்காலிக போக்குவரத்து கட்டுப்பாடுகள் ஏற்படலாம்.*

*பயணம் தொடங்குவதற்கு இரண்டு மணி நேரத்திற்கு முன்பாக கனரக வாகனங்கள் அந்த பாதைகளில் அனுமதிக்கப்பட மாட்டாது.*

*பொதுமக்கள் மற்றும் வாகன ஓட்டுநர்கள் மேலே கூறப்பட்ட மாற்றுப் பாதைகளை பயன்படுத்தி போக்குவரத்தை மேற்கொள்ளுமாறு பொலிஸார் கேட்டுக்கொள்கிறார்கள்.*

***பொலிஸ் ஊடகப் பிரிவு***